# සිංහල භාෂාව හා සාහිත්‍යය


## 7 ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

## කතා බහට සංයමයක්



**ලිඛිත අභ්‍යාස**

01 පහත දක්වා ඇති දෙබස් කවුරුන් විසින් සිදු කරන ලද ප්‍රකාශන ද යන්න තෝරන්න.

I " විදානේ රාලහාමි පැමිණිලා ද? " =

II " මොකද මල්ලී , මොනවත් බැරි වුණා ද? " =

III " කවදා ද අප්පච්චි මං ආයෙ එන්නේ? " =

IV " එහෙමයි , අපේ හාමුදුරුවනේ . මට යන්ඩ අවසර" =

V " මං ලොකු වුණා ම ටිකට් විකුණන කෙනෙක් වෙන්න ඕනෑ" =

| |
|---|
| නිමල් , උපාසක තැන , ටොට්ටෝ චං , අක්කා , සුනිල් , විහාරාධිපති ස්වාමීන් වහන්සේ |

02 නිවැරදි උක්ත පදය යොදා හිස්තැන් පුරවන්න.

I .................... දක්ෂයෝ වෙමු.

II .................... හේන් වගා කරති.

III .................... බඩු විකුණයි.

IV ............................. සැකකරුවන් උසාවියට ඉදිරිපත් කරති.

V .................... බත් පිසුවා ය.

( මම, පොලිස් නිලධාරීහු ,ගොවියෝ ,අපි ,අම්මා, වෙළෙන්දා )

අන්තර්ගතය :- ඩබ් . කේ . ඩී .එස් .ශානුක මයා - වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව

සැකසුම :- ජී .කේ.එස් .ඩී .ජයරත්න - වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය

Copyright©www.e-thaksalawa.moe.gov.lk

03 පහත ප්‍රකාශ හරි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( × ) ලකුණ ද යොදන්න.

I සංවාදයක් සිදු වන්නේ පුද්ගලයින් දෙදෙනෙක් හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් අතරය. (   )

II ස්ථානයේ ස්වභාවය අනුව සංවාද වෙනස් නො වේ. (   )

III සංයමයෙන් යුක්තව සවන් දීම සංවාදයක ප්‍රධාන ලක්ෂණයකි. (   )

IV පුද්ගල විවිධත්වය එකිනෙකා අතර කතා බහ කිරීමේ දී වැදගත් නො වේ. (   )

V අඹ යහළුවෝ නවකතාවේ සංවාදය නාගරික ජන සමාජයක් වටා නිර්මාණය වී ඇත. (   )

04 උක්තයට අනුව ආඛ්‍යාතය ගළපා ලියන්න.

I තරු පෙළ අහසේ .................... ( බබළයි / බබළති )

II මම ගමට .................... ( ගියෙමි / ගියෙමු )

III වැඩිහිටියෝ නිතර අපට අවවාද .................... ( දෙති / දෙයි )

IV නුඹලා බිතුසිතුවම් .................... ( නරඹන්නෙහි / නරඹන්නෙහු )

V සංගීත විශාරදයා ගීතය .................... ( ගයයි / ගයති )

05 පහත දැක්වෙන වචනවලට ගැළපෙන තනිපදය තෝරා ලියන්න.

I යුද්ධයේ දී අඳින ලෝහමය හැට්ටය. =

II අනුන්ට හිංසා කිරීම. =

III මනුෂ්‍යයන්ට අධිපති =

IV චිත්‍ර අඳින ලද වස්ත්‍රය =

V ඉතා වේගයෙන් ගමන් ඇති =

| |
|---|
| පෙතිකඩ , නරපති , අතිජව ආකරය , පරපීඩනය , සන්නාහය |

අන්තර්ගතය :- ඩබ් . කේ . ඩී .එස් .ශානුක මයා - වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව

සැකසුම :- ජී .කේ.එස් .ඩී .ජයරත්න - වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය

Copyright©www.e-thaksalawa.moe.gov.lk